# අදිසි

ජගත් ජේ එදිරිසිංහ ලියයි

18



**රණසිංහ රජ කරවන්නට කාලයක් තමා දරදිය ඇද්දේ කිසියම් ආත්මලාභයක් ලබාගැනීමේ අපේක්ෂාවෙන් නොවීම තමාගෙ දුර්වල කමක් සේ සැළකිය හැකිදැයි සුනන්ද සිතමින් සිටියි. රණසිංහ යනු තවත් එක් කපටි දේශපාලකයකු පමණක්ය යන සත්‍යය තමා නොදැන සිටියා ද? ඔහුගේ සෙවණැල්ල යට දී එය නොවැටහුණේ කෙසේ ද? රණසිංහ හා ඒ සා විශාල කාලයක් ඇසුරු කළ තමාට නොවැටහුණ යථාව වින්ධ්‍යා ඉතා කෙටි කලකදී තේරුම් ගත්තේ කෙසේ ද?**

අපේ හාමුදුරුවනේ... අපේ හාමුදුරුවනේ.." සෙදෝරිස් ගේ කෑ ගැසීම ඇසෙන්නේ මහ ගේට්ටුව දෙසින් ය. ඔහු යම් කිසි කරුණක් හේතුවෙන් කලබලයට පත්ව සිටියි. මහත් ඕනෑ කමකින් කියවමින් සිටි පොත වසා දමා පොඩි හාමුදුරුවන් කඩිමුඩියේ එදෙසට යන්නට සැරසෙන්නේ ඒ බව දැනුණ නිසා ය.

පොඩි හාමුදුරුවන් මිදුලට බසින විටත් සෙදෝරිස් එතැන ය. ඔහු හති දමන්නේ වයසට නොගැලපෙන වේගයකින් දුව ආ නිසා ය. යමක් අසන්නට පෙරම සෙදෝරිස් අතේ ගුලි කරගෙන සිටි කඩදාසිය පොඩි හමුදුරුවන්ට දිග හැර පෙන්වයි. කඩදාසියේ පොල්ගෙඩි අකුරෙන් ලියා ඇති අසැබි වදන් පෙළ පොඩි හාමුදුරුවන් සිත ඇති කරන්නේ අපුලකි.

"තාප්පෙ දිගටම අලවලා තියෙනවා..." සෙදෝරිස් හති දමමින් කියයි. තමාගෙ ප්‍රවෘත්තියෙන් පොඩි හාමුදරුවන් කලබලයට පත් වනු ඇතැයි සෙදෝරිස් බලාපොරොත්තු වුව ද එවැන්නක් සිදුවන බවක් නොපෙනෙයි. බැඳගත් දෑතින් යුතුව පොඩි හාමුදුරුවෝ තවමත් සෙදෝරිස් දෙස බලාගත්වනම සිටිති.. ".. ලොකු හාමුදරුවො දැක්කොත් හොඳ නෑ අපේ හාමුදරුවනේ.. මං විගැහින් අනිත් ඒවාත් ගලවලා දාන්නං.. අම්මපා මගෙ ඇඟ නලියනවා... මංට හෙණ හත වදින්නඩ එපායැ අර තරං පිං කඳකට මෙහෙම අහස පෙළොව නුහුලන කතා ලියන්ඩ.. අසමජ්ජාති බල්ලො.. "

"සෙදෝරිස් උන්නැහේ..."

"අපේ හාමුදරුවනේ..?"

"ඔක්කොටම ඉස්සෙල්ල හිත සන්සුන් කරගන්ඩ.. තාප්පෙ ඇලෙව්ව පෝස්ටර් අපේ හිත් වල අලවගන්ඩ ඕනෙ නෑනෙ.."

"ඒක හරි අපේ හාමුදරුවනේ.. කියවලා කියවලා පාරේ යන එන එවුන් ඒවා හිත්වල අලවාගන්ඩ කලියෙන් මං ඒ ටික ගලවලා එන්නං.." සෙදෝරිස් මුමුණමින් ඉදිරියට යයි. අතරමග නැවතී තවමත් නොසෙල්වී බලා සිටිනා පොඩි හාමුදරුවන් දෙස බලයි. ".. මේ ගෙන්දගං පොළවට ඔය බණ හරියන්නෙ නැති වෙලාවක් එනවා අපේ හාමුදුරුවනේ.. පොල්ලකින් දෙකක් ඇනලා තේරුම් කරන්ඩ ඕනෙ එකාට බණ පදයක් කිව්වට හරි යන එකක් නැතිවෙයි..."

000000

රණසිංහ සිටියේ මහත් වෙහෙසට පත්ව ය. කාමරයට වැදී ඇති තරම් නිදා ගන්නට ඔහුට අවශ්‍යව තිබුණි. සියළුම රංග කාර්යයන් දැන් අවසන්ව ඇත. දැන් ඇත්තේ නරඹන්නන්ගෙ විනිශ්චය කුමක්දැයි පසෙකට වී බලා සිටීම පමණකි.

තමන්ට අවාසි සහගත ඡන්ද මධ්‍යස්ථාන පිළිබඳ සොයා බලා පිළියම් යොදන්නට රණසිංහ උදය වරුවම ගත කළේ ය. සියල්ල සැළසුම් කළ පරිදි නිසි සේ සිදුවනු ඇති බව ඔහුට විශ්වාස ය. අවශ්‍ය තරම් ඡන්ද තමා වෙනුවෙන් දම්මවන්නට අවශ්‍ය කරන සියළු කටයුතු අජිත් විසින් සැළසුම් සහගත ලෙස මෙහෙයවනු ලබනු ඇති බව රණසිංහ දනියි.

වරින් වර ජංගම දුරකතනයට ලැබෙන අජිත්ගේ ඇමතුම් මගින් දැනුවත් කෙරෙන ඡන්ද ව්‍යාපාරයේ ප්‍රගතිය පිළිබඳව රණසිංහ මහත් සතුටට පත්ව සිටියි.

"සුනන්ද වෙනුවට උඹ මේ වෙලාවෙ මාළඟ හිටිය එක හොඳයි මල්ලි.. සුනන්ද කියන්නෙ කවදාවත් හොර චන්දයක් වත් දම්මන්න අකමැති වෙච්ච එකෙක්.. එහෙව් එකෙක් මේ ක්‍රමය තුළ වැදගත් වෙන්නෙ නැහැ බං.." අවසාන වතාටව අජිත් කතා කළ අවස්ථාවේ රණසිංහ කීවේ ය.

"පන්සලේ පෝස්ටර් ඇලෙව්වෙ අපේ උන් නෙවෙයි... මේ වෙලාවෙ ඒ වගේ ගොං තකතීරු වැඩක් කරන්න මං දැනුවත්ව ඉඩ දෙන්නෙ නෑ.. මේ වැඩ අහවර වුණාම මං හොයාගන්නං ඒක කළේ කවුද කියලා.."

"දැන් ඒව අවශ්‍ය නැහැ... රණසිංහ අයිය දැන් ටිකක් නිදාගන්න.. රෑට නිදිමරන්නත් තියෙන ඒකේ දැන් ටිකක් නිදාගන්න.." අයෝමා කියයි. වෙනදා ඉතා සීරුවට පීරා සකස් කර තිබෙන ඇගේ කෙස් කළඹ අවුල්ව තිබෙණු රණසිංහට පෙනෙයි. තෙහෙට්ටුව ඇගේ මුහුණේ ද මනාව ඇඳී ඇත. තමා වෙනුවෙන් ඇගේ කැපවීම කෙසේ අගයන්නදැයි රණසිංහට නොවැටහෙයි.

"රෑට කච්චේරියට යන්න ඔයත් එනව නේද..?" රණසිංහ අසයි.

අයෝමා එකවර පිළිතුරක් නොදෙයි.

"ඇයි..? එන්නැද්ද..?"

"අද හවස් වෙනකොට මගේ ඩියුටිය ඉවරයි..." අයෝමා සිනාසෙයි. "මං හිතන්නෙ මං මගේ උපරිම ශක්තියෙන් කරන්න පුලුවන් හැම දේම කළා... ඡන්ද ගණිනවා බලන්න මං ඕනෙ නැහැනෙ අයියෙ.."

රණසිංහ නැගිට ඇය වෙත එයි. දෑතම ඇගේ දෙඋර මතා තබා ඇගේ මුහුණට එබී බලයි.

"ඔයාගෙ ඩියුටිය ඉවර නැහැ අයෝ... පොඩි විවේකයක් ගන්න.. අපි දෙන්නට එකතු වෙලා කරන්න වැඩ ගොඩක් ඉදිරියේ තියෙනවා.. මහ ගොඩක්... මේ ටිකේ ඔයා මේ කළ දේවල් වලට ඔයාට ස්තූති කරන්න මා ළඟ වචන නැහැ... "

"ඒ ගැන ඒ තරම් හිතන්න දෙයක් නැහැ අයියෙ.. මං ඔයාට යමක් දුන්නා වගේම මාත් යමක් ලබා ගත්තා.. මේක පොඩි ගනුදෙනුවක් විතරයි..."

"හිතන්න දේවල් තියෙනවා.. ගොඩක් දේ තියෙනවා.. මං මේ හැම වැඩක් අස්සෙම ඒ දේ හිතුවා.." ඔහු කතාව මඳකට නවත්වා ඇගේ දෑස් තුළට එබෙයි. " අයෝ... මං ඔයාව බඳිනවා..."

අයෝමා සීරුවෙන් ඔහුගේ දෑත ඉවත් කරයි. ඔහු ගොස් ඇති දුර අනවශ්‍ය තරම් වැඩි ය. මේ ගනුදෙනුව ඉක්මනින් අවසන් කළ යුතු යයි ඇයට සිතෙයි. "ඒ තරං දුර හිතන්න එපා... මං ඇත්තම කියන්නං... එම්පීකෙනෙක්ගෙ වයිෆ් වෙලා ඉන්න මගේ අදහසක් නැහැ අයියෙ.." ඈ කියන්නේ එනිසා ය.

ඒ ඔහු බලාපොරොත්තු නොවන ආකාරයේ ප්‍රකාශයකි. ඔහු විමතියෙන් මෙන් ඈ දෙස බලා සිටියි.

"පුදුම වෙන්න දෙයක් නැහැ අයියෙ.. ඇත්තම කිව්වොත් මට ඕනෙ එයිට වඩා වෙනස් ගමනක්..... එයිට වඩා දුර ගමනක් යන්නයි"

"දුර ගමනක්...? මට තේරුණේ නැහැ.."

ඔහුට පිළිතුරක් දෙන්නට ඇගේ අදහසක් නැත. මේ එයට වේලාව නොවේ. ඕ අත් බෑගය අතට ගනියි.

"තේරුම් ගන්න මහන්සි වෙන්න එපා.. දැන් නිදාගන්න.."

අයෝමා ඔහුගෙන් අවසරයක් නොපතා ම පඩිපෙළ බැසගොස් වාහනයට නගියි. වාහනයේ පසුපස අසුණේ වාඩි වී හැරී බලන ඇයට දොරකඩට වී තවමත් තමා දෙස බලා සිටින රණසිංහ පෙනෙයි. ඔහු පිළිබඳ හටගත් සියුම් කණගාටුවක් විදුලියක් සේ මොහොතකට ඇගේ සිත පෙළයි. ඒ හැඟීමට තමා යට කරගන්නට ඉඩක් දෙන්නට දැන් අවකාශයක් නැත. මේ යන්ත්‍රය නැවැත්වීමේ හැකියාවක් තමාට නැති බව ඇය දනියි. කළ හැකි එකම දෙය බලා සිටීම පමණකි. කළ යුතු එකම දෙය මේ ක්‍රමය තුළ තමාගේ තැන තහවුරු කර ගැනීම පමණකි. ඒ කරුණේදී දැනටමත් තමා දිනා ඇති බව අයෝමා දනියි. හෙට උපදින දිනය වඩා වැදගත් දිනයක් වනු ඇති බව ඇයට විශ්වාස ය.

අයෝමා අත ඔසවා රණසිංහගෙන් සමු ගනියි.

"අපි යං..." ඕ රියැදුරාට කියයි.

00000

"මේ විකාර ක්‍රමේ ඉවර කරන්ඩ එකෙක් නෑනෙ අම්මපා.. මේක මහ විහිලුවක් වෙලා... චන්ද චන්ද චන්ද.. කෙළවරක් නැති චන්ද.. උං යනවා මුං එනවා මුං යනවා උං එනවා.. එච්චරයි.. රටේ ධනයෙන් කොයි තරම් නම් ප්‍රමාණයක් මේ චන්ද වෙනුවෙන් නාස්ති වෙනවද කියල මුං එකෙක් වත් කල්පනා නොකරණ හැටි.. උන්ට මොකද... උන්ගෙ සාක්කුවෙන් හරි අම්ම අප්පගෙන් හරි වියදම් වෙන සල්ලි නෙවෙයිනෙ.. රටේ දුප්පත් මහජනතාවගෙ සල්ලි නේද මේ.." කුසල් කීවේ සවස තේ මේසයේ දී ය. මැතිවරණය නිසා දින කීපයක් ඉදිකිරීම් කටයුතු නවත්වන්නට සිදුවීම පිළිබඳව ඔහු මහත් සේ අප්‍රසාදයට පත්ව සිටියි. එක පිම්මේ යමක් ඉදිරියට කරගෙන යන්නට නොහැකි වීම ඔහු නුරුස්සයි. දැන් මහ මැතිවරණයයි. ඉන් පසු අලුත් අවුරුද්දයි. මේ සෑම නිවාඩුවකටම සිය ව්‍යාපෘතිය වරින් වර නවත්වන්නට සිදුවීම අප්‍රසන්න අද්දැකීමකි.

"මිනිස්සුන්ටත් පිස්සු.. කාවවත් රජ කරන්ඩ තමන්ගෙ වැඩත් පාඩු කරගෙන මහන්සි වෙනවා.. රජ වෙන එවුන්ට අන්තිමේ මතකත් නැහැ තමං රජ පුටුවලට ආවෙ කාගෙ කර පිටිංද කියල .." වින්ධ්‍යා සිතා මතා නොකීවද ඇගේ කතාව අනියමින් තමාට එල්ල වන බව සුනන්දට දනියි.

රණසිංහ රජ කරවන්නට කාලයක් තමා දරදිය ඇද්දේ කිසියම් ආත්මලාභයක් ලබාග ැනීමේ අපේක්ෂාවෙන් නොවීම තමාගෙ දුර්වල කමක් සේ සැළකිය හැකිදැයි සුනන්ද සිතමින් සිටියි. රණසිංහ යනු තවත් එක් කපටි දේශපාලකයකු පමණක්ය යන සත්‍යය තමා නොදැන සිටියා ද? ඔහුගේ සෙවණැල්ල යට දී එය නොවැටහුණේ කෙසේ ද? රණසිංහ හා ඒ සා විශාල කාලයක් ඇසුරු කළ තමාට නොවැටහුණ යථාව වින්ධ්‍යා ඉතා කෙටි කලකදී තේරුම් ගත්තේ කෙසේ ද?

"මිනිස්සු හුඟක් දේ තේරුම් ගන්නෙ කාලයක් ගතවුනාට පස්සෙ.. " සුනන්ද කියන්නේ

අනෙක් පිටුවට